සැ. යු. — 2012.10.19 දින පළ වූ අංක 1,781 දරන ගැසට් පත්‍රයේ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,782 - 2012 ඔක්තෝබර් 25 වැනි බ්‍රහස්පතින්දා - 2012.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | 962 |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 963 |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 නොවැම්බර් මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 නොවැම්බර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පිස්කල් විකිණීම්

## කොළඹ දිසා අධිකරණයේ දී ය

සී/ස මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්,
ලංකා බැංකු මර්චන්ට් කුළුණ,
11 වැනි මහල (දැනට 10 වැනි මහල) අංක 28,
ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

කොළඹ දිසා අධිකරණ නඩු අංක : 17863/එම්.බී.
ගල්කිස්ස දිසා අධිකරණ අංකය : ඇස්. 46/12

.......................................................................... පැමිණිලිකරු.

*එදිරිව*

මොහොමඩ් ඉසඩීන් මරික්කාර් මොහොමඩ් සීමත්
අංක 42, ප්‍රේශර් පටුමග, දෙහිවල.

.......................................................................... *විත්තිකරු.*

කොළඹ දිසා අධිකරණයේ නඩු අංක 17863/එම්.බී. දරන නඩුවේ වර්ෂ 2008 ක් වූ ජූනි මස 03 වැනි දින ඇතුලත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාර :

*(අ)* ඉහත නම් සඳහන් විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයවිය යුතු, මෙම නඩුවේ නඩු නිමිත්ත මත කෙටි කාලීන ණය අංක STL/1151 යටතේ 2006/02/27 වැනි දිනට මුදලින් රුපියල් දාහත් ලක්ෂ අනූදහස් අටසිය නවයයි ශත අසූ හතරක (රු. 1,790,809.84) ක මුදලක් සහ එම මුදල මත 2006.02.28 වැනි දින සිට එම මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන තෙක් ඒ සඳහා මසකම 4% අනුප්‍රමාණයක පොළියක් ද,

*(ආ)* නඩු ගාස්තු සහ,

*(ඇ)* අගරු අධිකරණයට උචිත යැයි හැඟෙන වෙනත් සහ අනෙකුත් සහනයන් ලබා ගැනීම සඳහා විත්තිකරුට එරෙහිව නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක්, පැමිණිලිකරුගේ වාසියට ලබාදීම සම්බන්ධයෙන් විත්තිකරුට කිසිදු විරෝධතාවයක් නොමැති බවට විත්තිකරු වැඩිදුරටත් එකඟ වූ හෙයින් ද,

*(ඈ)* මෙහි වූ උපලේඛනයෙහි විස්තර කොට ඇති මුළු ඉඩම් කැබලි (මෙහි මින්මතු "උකස් කරන ලද දේපළ" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ මත පිහිටි ගොඩනැගිලි හා ව්‍යුහයන් ද, එකී උකස් කරන ලද දේපළ විෂයෙහි, එයින් එයට හෝ ඒ මත සියලු ඉඩකඩම්, අයිතිවාසිකම්, හිමිකම්, දේපළ සම්බන්ධතා, හිමිකම් පැමි හා ඉල්ලීම් ද සමඟ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ඩී. බක්මීවැව මහතා විසින් ලියා සහතික කරන ලද අංක 232 සහ වර්ෂ 2004/03/23 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය යටතේ හා ඒ ප්‍රකාර ඉහත කී මුදල අයකර ගැනීම පිණිස බැඳී ඇති බවට හා ක්‍රියාවේ යෙදවිය හැකි බවට සහ ඉහත කී මුදල අයකර ගැනීම අරබයා එකී උකස් බැඳුම්කරය ක්‍රියාවෙහි යෙදවීමට,

*(ඉ)* එකී මුදල, නඩු ගාස්තු සමඟ තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මාස (02) කාලයක් ඇතුළත පැමිණිලිකරුට ගෙවන ලෙස ආඥාකොට තීන්දු ප්‍රකාශ කර ඇති අතර, එසේ එකී මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් එකී මුදල් අයකර ගැනීම සඳහා පහත උපලේඛනයේ විස්තර වන නිශ්චල දේපළ බැඳී තිබෙන බවටත්, එම දේපළ වෙන්දේසිකර එම මුදල් අයකරදීම සඳහා කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රය ප්‍රකාරව එකී නිශ්චල දේපළ වර්ෂ 2012ක් වූ නොවැම්බර් මස 22 වැනි දින ප. ව. 2.00 ට එකී දේපළ පිහිටි දෙහිවල ප්‍රේෂර් පටුමගේ වරිපනම් අංක 44 දරන ස්ථානයේ දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැණුම් මිලෙන් සියයට 25 ක මුදලක් ද, පිස්කල් ගාස්තු රජයට අයවිය යුතු ගාස්තු (ෂවුන් ඩේජ් ගාස්තු) තක්සේරු ගාස්තු, වෙන්දේසිය ගැසට් පත්‍රයේ ගාස්තු සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් ද, එවෙලේම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් 75%ක ඉතිරි මුදල දින 30ක් ඇතුලත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ පිහිටි දෙහිවල ෆ්‍රෙෂර් පටුමගේ වරිපනම් අංක 44 දරන ස්ථානයේ පිහිටි "අළුත්වත්ත" යන ඉඩමට වර්ෂ 1989.04.22 දින ආර්. එන්. ද සිල්වා මානක තැන විසින් මැන සාදන ලද අංක 2427 දරන පිඹුර ප්‍රකාරව එකී පිඹුරේ කැබලි අංක 2184 ට මායිම් උතුරට : ඇන්ඩර්සන් පෙදෙසේ වරිපනම් අංක 21 දරන ස්ථානයේ පිහිටි කැබලි අංක 1792 බී සහ ඇන්ඩර්සන් පෙදෙසේ වරිපනම් අංක 19 දරන ස්ථානයේ පිහිටි කැබලි අංක 8 ඒ, නැගෙනහිරට : කැබලි අංක වයි සහ හිමිකම් පිඹුරු අංක 09179 හි කැබලි අංක 2 සහ දැනට තනි ඉඩමක් ලෙස සකස් කර ඇති ෆ්‍රෙෂර් පටුමගේ වරිපනම් අංක 42 දරන ඉඩම් කැබැල්ල, දකුණට : ෆ්‍රෙෂර් පටුමග දෙහිවල සහ බටහිරට : ඉසෙඩ් සහ ජී. ඒ. එස්. ද සිල්වාට අයත් ෆ්‍රෙෂර් පටුමගේ වරිපනම් අංක 46 දරන ඉඩම් කැබැල්ල යන මායිම් තුළ වූ පර්චස් දහයයි දශම හතයි එකක (අ. 0, රූ. 0, පර්. 10.71) විශාලත්වයෙන් යුතු ඉඩම් කැබැල්ල වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දෙහි. 66/234 සහ දෙහි. 66/174 යන පත්ඉරු වල ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - ගල්කිස්ස.

2012 ඔක්තෝබර් මස 05 වැනි දින,
ගල්කිස්ස දිසා අධිකරණයේ දී ය.

10-1064

## පිස්කල් වෙන්දේසියේ විකිණීම

### මිනුවන්ගොඩ දිසා අධිකරණයේ දී ය.

ගම්පහ සමූපාකාර සංවර්ධන සහකාර කොමසාරිස්,
වලව්වත්ත,
කිඩගම්මුල්ල, ගම්පහ.

.............................................................පැමිණිලිකරු.

*එදිරිව*

ගම්පහ දිසා අධිකරණයේ නඩු අංකය : 4317/විශේෂ
පිස්කල් ආඥා අංකය : 16/2012
වටිනාකම : රු. 1,910,350

01. කේ. පී. සෝමපාල,
451/2/ඒ, සියඹලාපෙ උතුර, සියඹලාපෙ

02. සමන්ත නාරායන,
අංක 430/2, සියඹලාපෙ උතුර, සියඹලාපෙ

03. එන්. නිකපිටිය
අංක 451/2/ඒ, සියඹලාපෙ උතුර, සියඹලාපෙ

..............................................................විත්තිකරුවෝ.

ඉහත අංක දරන නඩුවේ මෙම අධිකරණයේ 2012.02.09 දිනැති නියෝගය ප්‍රකාරව එකී නඩුවේ 01, 02 සහ 03 වැනි විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට අයවීමට ඇති රුපියල් දහනව ලක්ෂ දහදහස් තුන්සිය පනහ (රු. 1,910,350) ක මුදලක් සහ ඒ මත එකී මුදල ගෙවා අවසන් වන දින දක්වා වර්ෂයකට සියයට දහඅට (18%) බැගින් පොලියක් ද ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් සහ එකී මුදල් නිසියාකාරව ගෙවා නොමැති බැවින් එකී මුදල මත නීතිමය පොලිය ද, නඩු ගාස්තු ද ඇස්කිසි ගාස්තු සහ පිස්කල් ගාස්තු ද අය කර ගැනීම සඳහා වර්ෂ 2012ක් වූ අගෝස්තු මස 29 වැනි දින තහනමට ගන්නා ලද එකී නඩුවේ 01 වැනි විත්තකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළෙහි ඔහුට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම් ද වර්ෂ 2012ක් වූ දෙසැම්බර් මස 01 වැනි දින පෙ. ව. 10.00 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, යටිගහපත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් බලගල්ල යන ගම පිහිටි වැරැල්ලගහලන්ද කියන ඉඩම් කොටස නැමැති ඉඩමෙන් බෙදා වෙන් කළ කැබලි අංක 11 දරන කොටස සඳහා සර්වේ ජනරාල් විසින් මැන සාදන ලද අංක 1852 සහ 1992.08.24 දිනත් දරන ප්ලෑනයේ ප්‍රකාර මායිම් උතුරට කැබලි අංක 09 සහ 05 ද, නැගෙනහිරට : කැබලි අංක 05 සහ 12 ද, දකුණට : කැබලි අංක 10 සහ 16 ද, බස්නාහිරට : කැබලි අංක 10 සහ 09 ද මායිම් වූ රූඩ් දෙකයි පර්චස් එකයි දශම හතර (අ. 0, රූ. 2, පර්. 1.4) ක් හෙවත් හෙක්ටයාර් 0.206 ක් විශාල ඉඩම වෙනුවට මැතක දී කරන ලද නව මැනීමකට අනුව බෙදා වෙන් කළ ලොට් 11 දරන ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ඒ. රූපසිංහ මහතා විසින් 2007.07.07 දින මැන බෙදා සාදන ලද අංක 122/7 දරන ප්ලෑනය ප්‍රකාර මායිම්, උතුරට : අංක ගම් 1852 මූලික පිඹුරේ කැබලි අංක 09 සහ 05 (මාර්ගය) ද, නැගෙනහිරට : අංක ගම් 1,852 මූලික පිඹුරේ කැබලි අංක 05 (මාර්ගය) සහ 12 ද, දකුණට : අංක ගම් 1,852 මූලික පිඹුරේ කැබලි අංක 16 (ප්‍රාදේශීය සභා මාර්ගයේ රක්ෂිතය) සහ අංක 10 ද, බටහිරට : ගම් 1,852 මූලික පිඹුරේ කැබලි අංක 10 සහ 09 දරන කොටස් ද මායිම් වූ රූඩ් දෙකයි පර්චස් බින්දුවයි දශම දෙකයි තුන (අ. 0, රූ. 2, පර්. 0.23) හෙවත් හෙක්ටයාර් 0.20292 ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගස කොළ පලතුරු යනාදී සියලු දෙය ද වේ. (මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 345/113 හි ලියා පදිංචි වී ඇත)

රෙජිස්ට්‍රාර් පිස්කල් දිසා,
දිසා අධිකරණය - මිනුවන්ගොඩ.

වර්ෂ 2012 ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින.

10-945

---

# නොතාරිස් ලැයිස්තුව

ලොට් අංකය 2269.

### නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 04 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :-

01. පිළියන්දල, මාකන්දන, මොරදෑ පාර, අංක 19/5ඒ හි ප්‍රධාන කාර්යාලය සහිතව, පිළියන්දල, මාකන්දන, මොරදෑ පාර, අංක 19/5ඒ හි පදිංචි, දෙල්ගහදෙනිය දිසානායක මුදියන්සේලාගේ අනුර බණ්ඩාර පියවඩන මහතා, පානදුර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

02. අලව්ව, මහරච්චිමුල්ල, අංක 23 හි ප්‍රධාන කාර්යාලය සහිතව, අලව්ව, මහරච්චිමුල්ල, තිබ්බොටුව වත්ත හි පදිංචි, මංචනායක අප්පුහාමිල්ලාගේ ජයසිරි මහතා, කුරුණෑගල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

03. රත්නපුර දේවාලය ගාව, අංක 211/20හි ප්‍රධාන කාර්යාලය සහිතව, රත්නපුර, දේවාලය ගාව, අංක 211/20හි පදිංචි, වෙත්තසිංහ හල්ගමුව අප්පුහාමිලාගේ චන්ද්‍රසිරි මහතා, රත්නපුර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය.

2012 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ 07.

10-1102/1

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 03 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ.

01. අටබාගේ, දැල්පිටිය, ස්ටෝෆීල්ඩ් නිවාස යෝජනා ක්‍රමය, අංක 80 හි පදිංචි, නිලූෂි දමයන්ති උයන්වත්ත මහත්මිය, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

02. කොළඹ 05, කිරුලපන, ඩී. එම්. කොළඹගේ මාවත, අංක 41/20 හි පදිංචි, වරුණ තුෂාර සම්පත් සිරිමාන්න මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

03. පිළියන්දල, මඩපාත, මාකන්දන, ග්‍රාම සංවර්ධන මාවත, අංක 120/5 හි පදිංචි, මිදිගම විතානගේ ලෙවනාර්ද ලැනරොල් චමිලා මහත්මිය, පානදුර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

04. බණ්ඩාරවෙල, අඹතැන්න වත්ත, පහළ කොටස, අංක 109 හි පදිංචි, කුසලා මනෝරංජනී කුමාරි විජේකෝන් මහත්මිය, බදුල්ල අධිකරණ කාලපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

05. පානදුර, නල්ලුරුව මැදවෙල්ල පාර, අංක 12/15ඩී හි පදිංචි, කටුවාවල වඩුගේ සුනේත්‍රා ධම්මික වීරසිංහ මහත්මිය, පානදුර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

06. මොරටුව, කඩලාන, ගල්පොත්ත පාර, අංක 38 හි පදිංචි, කොළඹපටබැඳිගේ ටෝනි ඉසුරු ශ්‍රී සමත් පීරිස් මහතා, පානදුර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

07. කෑගල්ල, ඉඹුල්ගස්දෙණිය, අංක 127/3 හි පදිංචි, දිසානායක මුදියන්සේලාගේ පියදාස මැදගෙදර මහතා, කෑගල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

08. උහුමීය, ගෙපල්ලව, 9 පටුමග ඒ එන්. එම්. අප්පුහාමි මාවත හි පදිංචි, ජයසූරිය ආරච්චිගේ දොන් ස්ටැන්ලි හර්බට් මහතා, කුරුණෑගල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

09. කුරුණෑගල, වැහැර පන්සල පාර, අංක 12 හි පදිංචි, ශ්‍රිනාරායන බමුණු මුදියන්සේලාගේ චන්දිම සමීර බණ්ඩාර ශ්‍රීනාරායන මහතා, කුරුණෑගල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

10. කොළඹ 05, හැව්ලොක්පාර, අංක 210 බී හි පදිංචි, බෝවත්තේ ගෙදර දෝන ක්‍රිෂානි ඒකනායක මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

11. පිටකෝට්ටේ, බැද්දගාන, 3 වැනි බැප්ටිස්ට් මාවත, අංක 82/7 හි පදිංචි, කුලතුංග මුදියන්සේලාගේ චානක නයන බණ්ඩාර කුලතුංග මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

12. අම්බලන්ගොඩ, කන්දෙගොඩ, අංක 387, "සඳුන්" හි පදිංචි, මාගිනා වරුණ චරිත් මිරණ්ඩු මහතා, බලපිටිය අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

13. බොරලැස්ගමුව, කටුවාවල පාර, අංක 8/2ඒ හි පදිංචි, කොඩිප්පිලි යසරත්නගේ ප්‍රියන්ත මානවංශ මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

14. මහනුවර, මාරස්සන, බෝපිටිය, අංක 28/1 හි පදිංචි, මැද ගෙදර ධම්මික ලසන්ත අමරසිංහ මහතා, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

15. පොතුවිල් -07, සම් සම් පාර හි පදිංචි, සේගු ඩාවුද් මොහමඩ් රාසික් මහතා, කල්මුනේ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

16. කොළඹ 05, කිරුළපන, ශ්‍රී සිද්ධාර්ථ පැසේජ්, අංක 33/16 හි පදිංචි, සශිකා සඳමාලි විතාරණ මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

17. මීගමුව, බෝලවලාන, මඩම පාර, අංක 42 හි පදිංචි, සර්ධාසේන රාලහාමිලාගේ චේතනී කෞශල්‍යා සේනාධිපති මෙනෙවිය, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

18. ගම්පහ හරහා, දෙමලගම (බ.ප.) අංක 2/75 හි පදිංචි, ආරියප්පෙරුම රාමණායකගේ මිණිකාන්ති රාජකරුණා සෙනෙවිරත්න මෙනවිය, ගම්පහ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

19. ගාල්ල, අගුළුගහ, කහඳ, දෙබරපිටිය වත්ත, අංක 240/1 හි පදිංචි, වතවන විතානගේ ඉරෝෂා ප්‍රශාදි මෙනෙවිය, ගාල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

20. රාජගිරිය, මැදවැලිකඩ පාර, අංක 76/5 හි පදිංචි, ගොවින්ද රත්නායක වාසළ මුදියන්සේලාගේ ප්‍රියංකා මැණිකේ වීරකෝන් මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

පී. බී. අබේකෝන්,<br>
ලේකම්,<br>
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ<br>
කටයුතු අමාත්‍යාංශය.

2012 සැප්තැම්බර් මස 14 වැනි දින,<br>
කොළඹ දී ය.

10-1102/2

---

## නොතාරිස් ආඥාපනත(පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 04 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ.

01. හාරිස්පත්තුව, මැදවල, බෝතොට, අංක 127/3 හි ප්‍රධාන කාර්යාලය සහිතව, හාරිස්පත්තුව, මැදවල, බෝතොට, අංක 127/3 හි පදිංචි, ඒකනායක මුදියන්සේලාගේ තිස්ස කුමාර ඒකනායක මහතා, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

02. දඹදෙණිය, කුලියාපිටිය පාර, අංක 93 හි ප්‍රධාන කාර්යාලය සහිතව, දඹදෙණිය, කුලියාපිටිය පාර, අංක 93 හි පදිංචි, රත්නායක මුදියන්සේලාගේ ගුණසේකර මහතා, කුරුණෑගල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

03. ගෝනපල හන්දිය, වීදියගොඩ පාර, අංක 231/බී1 හි ප්‍රධාන කාර්යාලය සහිතව, ගෝනපල හන්දිය, වීදියගොඩ පාර, අංක 231/බී1 හි පදිංචි, කොළඹගේ දොන් ප්‍රසන්න රවීන්ද්‍රනාත් බස්නායක මහතා, කළුතර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

04. ගම්පහ, ආනන්ද මාවත, අංක 21හි ප්‍රධාන කාර්යාලය සහිතව, ගම්පහ, ආනන්ද මාවත, අංක 21 හි පදිංචි, කරුණානායක මුදියන්සේලාගේ හරිස්චන්ද්‍ර කරුණානායක මහතා, ගම්පහ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

05. ඔඩ්ඩමාවඩි - 01, පාසැල් පාර, අංක 427 හි ප්‍රධාන කාර්යාලයද, සෙන්ගලඩි, චන්දාරුමුලෙයි, ආලෙයඩි වීදිය හි අතුරු කාර්යාලය ද සහිතව, ඔඩ්ඩමාවඩි - 01, පාසැල් පාර, අංක 427 හි පදිංචි, සාහුල් හමීඩ් මන්සූර් මහතා, මඩකලපුව අධිකරණ කාලපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2012 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ 07.

10-1102/3

---

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 03 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ.

01. කුරුණෑගල, වෙලන්ගොල්ල වත්ත, වෙලගෙදර උයන, අංක 251 හි පදිංචි, දිසානායක මුදියන්සේලාගේ සුචිර නන්ද බණ්ඩාර දිසානායක මහතා, කුරුණෑගල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

02. යගිරල, පිටවත්ත හි පදිංචි, නාකන්දලගේ දොන් ලක්මාල් ජයරංග මහතා, කළුතර අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

03. අගලවත්ත, කැකුලන්දල, දාපිලිගොඩ පාර, අංක 226ඒ හි පදිංචි, සිද්දි හලුගේ අනුෂා කුමාරි මහත්මිය, කළුතර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

04. කුරුණෑගල, පුත්තලම් පාර, මාවීදළුපොත, 10 පටුමග, අංක 1/168හි පදිංචි, සිරිල් විමලදාස වීරකෝන් රත්නායක මහතා, කුරුණෑගල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

05. මහනුවර, අස්ගිරිය, වාරියපොල ශ්‍රී සුමංගල මාවත, අංක 27/1 හි පදිංචි, රත්නායක මුදියන්සේලාගේ තිස්ස බණ්ඩාර රත්නායක මහතා, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

06. ජාඇල, ඒකල පාර, පන්සල පාර, අංක 21/2 හි පදිංචි, සුසිල් කුමාර වික්‍රම රත්නායක මහතා, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

07. දෙහිවල, කළුබෝවිල, හත්බෝධිය පාර, අංක 39/ඒ හි පදිංචි, ගිහාන් විදානගම මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

08. මාලඹේ, සුහද පෙදෙස, සුදර්ශන මාවත, අංක 267/14 හි පදිංචි, ඉනෝකා ප්‍රියංගනී සූරියආරච්චි මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

09. වත්තල, හැඳල, බලගල පාර, අංක 106 හි පදිංචි, දොන් අමිල සුයාම එගොඩමහවත්ත මහතා, ගම්පහ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

10. කඩවත, මංකඩ පාර, විහාර මාවත, සපුමල් පෙදෙස, අංක 725/2ඒ හි පදිංචි, රොෂාන් අක්මීමන මහතා, ගම්පහ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2012 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ 07.

10-1102/4

---

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 04 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ.

01. මහවැව, කොස්වාඩිය, මහවත්ත පාර, අංක 191 හි ප්‍රධාන කාර්යාලය සහිතව, මහවැව, කොස්වාඩිය, මහවත්ත පාර, අංක 191 හි පදිංචි, ඉලන්ගරත් ජේඩිගේ ආනන්ද කුමාරතුංග මහතා, හලාවත අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

02. අඹතැන්න, මුල්ලේගම, උයන්වත්ත, අංක 1/19 හි ප්‍රධාන කාර්යාලය ද, මහනුවර, කොටුගොඩැල්ල වීදිය, අංක 24 හි අතුරු කාර්යාලය ද සහිතව, අඹතැන්න, මුල්ලේගම, උයන්වත්ත, අංක 1/19 හි පදිංචි, කුලතුංග මුදියන්සේලාගේ රංජිත් කුලතුංග මහතා, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

03. ඇල්පිටිය, තල්ගස්පේ, පොල්ලැව්ව පාර, අංක 514/1 හි ප්‍රධාන කාර්යාලය සහිතව, ඇල්පිටිය, තල්ගස්පේ, පොල්ලැව් පාර, අංක 514/1 හි පදිංචි, කාරියවසම් සිත්තරගේ සෝමපාල මහතා, බලපිටිය අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

2012 සැප්තැම්බර් 14 වැනි දින,
කොළඹ 07.

10-1102/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.